# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිධකරණලදී.

නො. 7,314 — 1923ක්වූ මාර්තු මස 2වෙනි දිනවූ සිකුරාද.

# Part IV.—හතරවෙනි කාණ්ඩය.

---

## උපාංගනීති.

ඌව දිසාවේ සනීපාරක්ෂක සභාව විසින් 1913යේ 12වෙනි ආඥාපණතෙන්ද 1914යේ 30වෙනි ආඥාපණතෙන්ද 1922යේ 4වෙනි ආඥාපණතෙන්ද අමුතුකරනලද ප්‍රකාර "වර්ෂ 1892යේ කුඩානගර පිළිබඳ ආඥාපණතේ" 9 E (2) යන වගන්ති යටතේ සාදනලදුව කාරක මන්ත්‍රණ සභාවේ සම්මතය ඇතුව ගරුතර වැඩබලන ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් පිළිගන්නාලද මෙහි පහත සඳහන්වන අතුරුපණතේ සහ අයකරන ගණන් ලෙබනද මහජනයාගේ දැනගැනීම පිණිස ප්‍රසිධකරනු ලැබේ.

උතුමාණන්වහන්සේගේ අණපරිද්දෙන්,
බී. හෝර්ස්බරෝ,
වැඩබලන මහලේකම්තුමා වෙනුව.

වර්ෂ 1922ක්වූ දෙසැම්බර් මස 9වෙනි දින කොළඹ
මහලේකම්තුමාගේ උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

---

### සඳහන්කරනලද අතුරුපණත්.

#### 1වෙනි පරිච්ඡේදය. (9 E (2) (a) යන වගන්තිය.)

සභාව පවත්වන වේලාව සහ ස්ථානයත් එහි පිළිපැදියයුතු ක්‍රමයත් මෙසේයි:—

1\. ක්‍රියා සම්පාදනය උවමනාවූ යම් කාලයක සභාවේ සාමාන්‍ය රැස්වීම් අපරභාග එකට බදුල්ලේ කච්චේරියේදී පවත්වනු ලැබේ. එසේවූවද යම් රැස්වීමක් අන්කිසි දිනයකට හෝ වේලාවකට කල්දැමීම සභාවට ව්‍යවස්ථානුකූලවේ.

2\. සභාව සම්බන්ධ සියලුම කටයුතුවලදී සමාජිකයන්ගේ උස්පහත් පිළිවෙළ සහ ප්‍රථම ස්ථානය පහත දක්වනාකාර වියයුතුයි. (a) නිලබලයෙන්ම පත්වන සභාපතිතැන, (b) ගැසට් පත්‍රයේ ප්‍රසිධකර තිබෙන පිළිවෙළින් ආණ්ඩුකාරයාණන් විසින් පත්කරනලද සමාජිකවරු.

3\. සභාපතිතැන විසින් සභාව නිසිසේ හසුරුවාගත යුතුයි. වියවුල් සහිත සියලුම කාරණාද බේරුම්කළ යුතුයි.

4\. (සාමාන්‍ය හෝ විශෙෂ) රැස්වීමකට නියමකරනලද කාලය ඉකුත්වූ වහාම කටයුතුකිරීමට සෑහෙයයි වැටහෙන සමාජිකයන් ගණනක් පැමිණිකල්හි සභාපතිකමට නිසිව සිටින සමාජිකතැන මූලාසනය භාරගෙන සභාවේ කටයුතුකිරීම ආරම්භකළ යුතුයි. නියමකරනලද කාලයෙන් පැය භාගයක් ගතවූවිට සමාජිකවරුන් සෑහෙන ගණනක් නොපැමිණ සිටියොත් එය සාමාන්‍ය රැස්වීමක්නම් ඊළඟ සාමාන්‍ය සභාරැස්වීමට නියමකරනලද දිනය වනතුරු කල්දැමිය යුතුයි. එය විශෙෂ සභාරැස්වීමක්නම් දිනයක් නියම නොකර කල්දැමිය යුතුයි.

5\. සභාවේ කාර්‍යකරන අතරතුරේදී මිස නොහොත් හදිස්සියක් ගැන සභාවේ විශෙෂ අවසරයපිට මිස එසේ නැතුව යම් සමාජිකයෙක් ප්‍රශ්නයක් ඇසීමට හෝ යෝජනාවක් කිරීමට කැමති නම් එවැනි ප්‍රශ්නය හෝ යෝජනාව සම්බන්ධ දැන්වීමක් සභාවේ ඉහත රැස්වීම් දිනයක හෝ ඔහු එවැනි ප්‍රශ්නය හෝ යොජනාව කරන්ට අදහස්කරන දිනයට ඉතාම අඩුගණනේ දවස් හයකට ප්‍රථමයෙන් හෝ කළයුතුයි.

6\. සෑම සමාජිකවරුන් විසින් එවැනි දැන්වීමක් කරන අතර එම ප්‍රශ්නයේ හෝ යොජනාවේ පිටපතක් සභාපතිතැනට භාරදිය යුතුයි.

7\. සභාව අන්කිසි විධියක නිශ්චයක් කරන්නේනම් මිස නැත්නම් රැස්වීමකදී අසනුලබන ප්‍රශ්න සහ කරනුලබන යොජනා ඒවා දැන්වීම්කර තිබෙන පිළිවෙළින් කළයුතුයි.

8\. ප්‍රතික්ෂෙපකරනලද යම්යොජනාවක් අඩුගණනේ තුන්මාසයක් ගතවනතුරු නැවත ඉදිරියට ගෙනඒම යුතු නොවේ. තවද රැස්වීමකදී සභාව විසින් පිළිගන්නාලද යොජනාවකට යම්කිසි විධියකින් විරුඬවූ අන්‍යවූ යොජනාවක් එම කාලය ඉකුත්වනතුරු භාරගනු නොලැබේ.

9\. අයදුම්පතක් හෝ යම්කිසි ලියවිල්ලක් සභාව ඉදිරියට ගෙනෙන සමාජිකතැන එහි අඩංගු කාරණ ගරුකටයුතු ලෙස තිබීම ගැන වගකිය යුතුයි. තවද ලිපිකරුගේ නම සහ ස්ථානයත් හරියාකාර සඳහන් නොකළ ලියවිල්ලක් සභාව ඉදිරියෙහි තැබීම තහනම් වේ.

10\. අයදුම්පතක් හෝ වෙන ලියවිල්ලක් පිළිගැන්වූකල එහි අදහස් කොටින් ප්‍රකාශ කළයුතුයි. තවද ස්ථිරකරනු ලැබූ යම්කිසි සමාජිකයෙකුගේ යොජනාව පිට එම ලියවිල්ල කියවිය යුතුද නොකියවිය යුතුද යන ප්‍රශ්නය අසනුලැබේ.

11\. සාමාන්‍ය රැස්වීම්වල කටයුතු පහත පෙන්වන පිළිවෙළින් කළයුතුයි.

(a) පසුගිය සභාවාරයේ වාර්තාව කියවා උවමනානම් වරද හරිගැස්සූ පසු ස්ථිරකරනුලැබීම.

(b) සභාවට එවනලද අයදුම්පත් හෝ වෙනයම් ලියවිලි සභාව ඉදිරියෙහි තබා ඒවා ගැන නිශ්චයක්කිරීම.

(c) අනිත් කටයුතු මින් පසුවට සඳහන්කරනුලබන පිළිවෙත් පොතෙහි සටහන්කර තිබෙන පිළිවෙළින් සාකච්ඡාකළ යුතුයි.

පසිප්ප නගරයෙහි ඉතාම කිට්ටුවෙන් තිබෙන කැනකුණු බැසයන කානුවලට හා කානුවලට හාවෙන්ට දූම්මට ලියවිල්ලකින් දැනුන්දෙන්ට සභාපතිතැනට බලය තිබේ. එම කානුව හෝ පසිප්ප සභාපතිතැන නියමකරන්නේ යම්සේද ඒ ආකාර ද්‍රව්‍යයන්ගෙන්ද, ඒ ආකාර ප්‍රමාණයෙන්ද, ඒ ආකාර මට්ටමෙන්ද, ඒ ආකාර බෑවුමකින්ද යුක්තවිය යුතුවා සහ යටකී කානුවලට හෝ කානුවට ඒ ආකාර ක්‍රමයකින් සන්ධිවනලෙස දූමියයුතුයි. නුමුත් හිමිකාරයා විසින් දූමියයුතුයයි නියමකරනලද කානුවලට හෝ පසිප්පවලට උවමනා ද්‍රව්‍යයන් ඔහුගේ ඉල්ළුම්පත්‍රයක් පිට ගත් මිලටම ඔහුට සභාව විසින් සපයාදෙනුලැබේ. එවැනි දැන්වීමක සඳහන්වන කරුණු නියමකරන කාලයතුළදී ඉෂ්ටකිරීම අතපසුකළොත් සභාපතිතැනට හෝ ඔහු විසින් අවසරදෙනුලැබූ මුලාදෑනියෙකුට හෝ මෙහෙකරුවන්ට එම භූමිභාගයකට ඇතුල්ව උවමනාකරනලද කෘත්‍යකරවාලීමට පුළුවන. තවද එහි වියදම් අයිතිකාරයා විසින් ගෙවියයුතුයි.

3වෙනි පරිච්ඡේදය. [9 E (2) (c) යන වගන්තිය.]

1. පාන් සෑදීමට පාවිච්චිකරන පිරිසිදු වතුර සහ අනිකුත් ද්‍රව්‍යයන් හොඳ යහපත් ඒවා වියයුතුයි. තවද සභාපතිතැන විසින් ලියවිල්ලකින් අවසර දෙනුලැබූ යම්කෙනෙකු විසින් කලින්කල ඒනයින් සැම්පල් ඉල්ලාසිටීමට නීතියේ ආකාර බලය තිබේ.

2. සෑම පාන්ගෙඩියේම මතුපිට එහිබර පැහැදිලිලෙස දක්වන්නාවූ ලකුණක් තිබියයුතුයි. එයාකාර දක්වනුලද බරට අඩුවූ පාන් විකුණන්නාවූ යමෙක් නීති විරෙධිදෙයක් කිරීමේ වරදකාරයාවේ.

4වෙනි පරිච්ඡේදය. A.—ප්‍රසිද්ධ වෙළඳශාලා.

1. ප්‍රසිද්ධ වෙළඳශාලාවක් පැවැත්වීමට සභාව විසින් ස්ථිරකරනුලැබූ කොයි කාලයක නමුත් එය විවෘතකරන කාලය දක්වා දහදවසකට අඩුනොවන දැන්වීමක් සභාපතිතැන විසින් දියයුතුයි. තවද එම දැන්වීම අණබෙර ගැස්වීමෙන් ප්‍රසිද්ධ කරනු ලැබේ.

2. සියලුම ප්‍රසිද්ධ වෙළඳශාලා දිනපතාම උදේ 6ගේ පටන් රාත්‍රි 9ය දක්වා ඇරතබනු ලැබේ. තවද වෙළඳශාලා නිසියාකාර එළියකිරීම සම්බන්ධ කටයුතුකිරීම සභාවේ හෝ එහි බදුකාරයාගේ යුතුකමවේ.

3. එක එක වෙළඳශාලාවේ සභාවේ මෙහෙකරුවන් හෝ බදුකාරයන් විසින් අයකළහැකි බදුමුදල් හා ගාස්තු අඩංගු පත්‍රයක් ඉංග්‍රීසි, සිංහල, දෙමළ යන භාෂාවලින් මුද්‍රණයකරවා එක එක වෙළඳශාලාවේ හොඳාකාර පෙණෙන ස්ථානයක සවිකළ යුතුයි. එවැනි දැන්වීමකින් අවසර දෙනුලබන ගණන් හැර ඊට වැඩිමිල ඉල්ලීමට හෝ බාරගැණීමට කිසිවෙකුට බලයනැත. සභාව විසින් පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙළඳශාලාවල අයකළහැකි බදු මුදල් සහ ගාස්තු පහත දක්වනාකාර වියයුතුයි:—

මස් වෙළඳම්පළ.—වෙළඳම පිණිස තබනලද එළුවෙක් හෝ බැටළුවෙක් නොවන අනිත් සෑම එකාටම දවසට .. .. .. .. ශත 50යි.
වෙළඳම පිණිස තබනලද එළුවෙකුට හෝ බැටළුවෙකුට .. .. .. ,, 25යි.
මාලු වෙළඳම්පළ.—අත්කරගන සිටින සෑම සතරැස් යාරයක බිමට දවසට .. .. ,, 10යි.
පලතුරු සහ එළවලු වෙළඳම්පළ.—අත්කරගන සිටින සෑම සතරැස් යාරයක බිමට දවසකට .. ,, 3යි.

4. සභාව විසින් විවෘතකර තිබෙන යම් වෙළඳශාලාවල යම් කොටසක් පාවිච්චිකිරීම ගැන ඉහතකී ප්‍රකාර ගාස්තු අයකිරීම වෙනුවට මාස්පතා ගෙවියයුතු බදු මුදලක් නියමකර එය අයකිරීමට සභාවට බලය තිබේ.

5. ප්‍රසිද්ධ වෙළඳශාලා සම්බන්ධ ගෙවියයුතු නොයෙක් බදු මුදල් සහ ගාස්තු කලින්කල කරන ඉල්ලීමපිට සභාපතිතැනට හෝ බදුකාරයාට හෝ ඒවා බාරගැනීමට සභාව විසින් හෝ ඔවුන්ගේ බදුකාරයා විසින් හෝ බලයදෙනලද වෙන අයට කලින් ගෙවියයුතුයි.

6. ඉහතකී ආකාර බලයදෙනලද බදු මුදල් හෝ ගාස්තු ගෙවීමට බැඳී සිටින යම් කෙනෙක් ඉල්ලුවිට එය නොගෙවත් නම් එවැනි බදු මුදල් හෝ ගාස්තු ගෙවීමට බැඳිසිටින අයට හිමිවූ හෝ ඔහුට අයිතිවූ හෝ ඔහුගේ බාරේ තිබෙන බඩු සියල්ලම හෝ එයින් ඕනෑම එකක් අල්වා විකිණීමෙන් එම ගණන අයකිරීමට සභාවට හෝ සභාපතිතැන විසින් බලය දෙනුලැබූ කෙනෙකුට පුළුවන.

7. ප්‍රසිද්ධ වෙළඳශාලාවක කිසිම කොටසක් බලපත්‍රයක් නැතිව පවත්වන්ට හෝ පාවිච්චිකිරීමට කිසිවෙකුට බැරිය. එම බලපත්‍රය මෙහි යොදා තිබෙන "A" ලෙඛනයේ පෙනෙන ආකාර වියයුතුයි. තවද ඔහු එවැනි බලපත්‍රයක සඳහන්වන කිසිමදේකට විරුද්ධව ක්‍රියාකොකළ යුතුයි. තවද වෙළඳශාලාවේ සවිකරනලද දැන්වීමකින් සභාව විසින් තැබීම හෝ විකිණීම තහනම්කරනුලැබූ යම් බඩුවක් එහි යම් තැනක විකිණීමට තැබීම කිසිවෙකුට යුතුනැත.

8. කිසිම මාලු වෙළඳම්පළක අලුත් මාලු හෝ ලුණු මාලු හැර වෙන කිසිම ද්‍රව්‍යයක් වෙළඳම් පිණිස තැබීමට කිසිවෙකුට යුතුනැත.

9. පලතුරු හෝ එළවලු වෙළඳම්පළක අලුත් පලතුරු සහ එළවලු හැර අලුත් හෝ ලුණු දමාපු කිසි මස් වර්ගයක් හෝ මාලු වර්ගයක් හෝ පිසනලද කිසිම කෑමක් හෝ කෑමටගන්නා වෙන කිසිම ද්‍රව්‍යයක් විකිණීම පිණිස නොතිබිය යුතුයි.

10. ප්‍රථමයෙන් සභාපතිතැනගෙන් ගන්නාලද අවසරය නැතිව වෙළඳපලක් භාරකාර කිසිවෙකුට වෙළඳශාලාවේ කිසිම පැත්තක් කිසිම විධියකින් කොටුකිරීමට හෝ කිසිම ක්‍රමයක ආවරණයක්කිරීමට සහ රාත්‍රි 9ගේ පටන් උදේ 6ය දක්වා කිසිම වෙළඳශාලාවක කිසිම බඩුවක් තිබායාමටද නොහැකිය.

11. යම්කිසි වෙළඳශාලාවක වෙළඳපළක් හෝ ස්ථානයක් හෝ වාඩිපළක් භාරව සිටින සෑම අයම ඒ වෙළඳපල හෝ වාඩිවන ස්ථානය කුණු කසළවලින් තොරකර පිරිසිදුව තබාගතයුතුයි. කිසිම වසංගත හෝ බෝවෙන රෝගයකින් පෙළෙන්නාවූ හෝ ප්‍රසිද්ධ වෙළඳශාලාවක් භාරව සිටින යමෙකු දැනුවත්ව එවැනි රෝගයකින් ලඟදී පෙළිසිටියාවූ හෝ එවැනි රෝගයකින් පෙළෙන්නෙකුට සාත්තුකිරීමෙහි ලඟදී යෙදී සිටියාවූ කිසිවෙක් ප්‍රසිද්ධ වෙළඳශාලාවක යම් වෙළඳපලක් හෝ ස්ථානයක් හෝ වාඩිපලක් භාරගැණීමට හෝ කිසිම ද්‍රව්‍යයක් එහි විකිණීමට තිබීම නොකළයුතුයි.

12. ප්‍රසිද්ධ වෙළඳශාලාවක යම් කොටසක් පාවිච්චිකරන්නාවූ හෝ වෙළඳම්කරන කිසිවෙක්—
(a) එවැනි වෙළඳම්ශාලාවක හෝ ඒ අසල නොගැලපෙන අන්දමේ හැසිරීම හෝ කිසිම අප්‍රිය දෙයක්කිරීමද;
(b) එවැනි කිසිම වෙළඳශාලාවක කිසිම පිසීමක් කිරීමද;
(c) ගනුදෙනුකිරීම රාත්‍රි 9යෙන් පසු නැවැත්තුවාට පසු තමා ගැන භාරගතහැකි කාරණ කියාදෙන්ට නොහැකිව එවැනි වෙළඳශාලාවක් තුළ හෝ ඒ අවට හැසිරීමද;
(d) ගොඩනැගිලිවල වෙළඳම්පළවල සහ ලාම්පුවල කිසිම කොටසකට හෝ එවැනි වෙළඳශාලාවක් තුළ හෝ අවට තිබෙන සභාවට අයිති කිසිම දෙයකට අනතුරුකිරීම හෝ එවැනි වෙළඳශාලාවක පාවිච්චියට සපයනලද වතුර නැතකිරීම හෝ අපිරිසිදුකිරීමද නොකළයුතුයි.

13. සනීපාරක්ෂක නගරයක සීමාතුළ විකිණීම පිණිස තබනලද හෝ ගෙනෙනලද කෑමට ගන්නා යම්කිසි මසක්, කුකුලන් ආදි සතුන්, මත්ස්‍යයන්, දඩමස්, මස්, එළවලු, පලතුරු හෝ වෙන යම්ක් මනුෂ්‍ය ආහාරයට භයානකයයි හෝ නොසෑහේයයි සභාවේ පරීක්ෂකතැන විසින් හෝ සෝදිසිකරන්නා විසින් අල්ලා ඒ ස්ථානයෙහි සිටින වෙද්‍ය මුලාදෑනියා වෙතට හෝ එවැනි මුලාදෑනියෙක් එහි නොසිටිනම් පොලිස් නඩුකාරතැන වෙතට හෝ පොලිස් උසාවියක් නැත්නම් ගම්සභාපතිතැන වෙතට හෝ ගෙනයෑම යුතුවේ.

තවද එමස්, කුකුලන් ආදී සතුන්, මාලු, එළවලු, පලතුරු හෝ කෑමට ගන්නා වෙනත් දේවල් මනුෂ්‍ය ආහාරයට නොහොබියයි වෛද්‍යමුලාදෑනිතැනට හෝ පොලිස්නඩුකාරතැනට හෝ ගම්සභාපතිතැනට හෝ පෙනේනම් එය විනාශකර දූම්ම හෝ කෑම පිණිස විකිණීම වලක්වන ක්‍රමයකට නැතිකරදූම්ම හෝ කළයුතුයි.

14. වෙළඳ ශාලාවේ සීමාතුළ යහපත් පැවතීම ඇතිකිරීම වෙළඳ ශාලාවක භාරකාරයාගේ හෝ බදුකාරයාගේ යුතුකම වන්නේය. තවද යම්කිසි වෙළඳ ශාලාවක වැඩ පිළිවෙළකිරීමට හෝ බදු මුදල් හෝ ගාස්තු අයකිරීමට හෝ එහි මනා පිළිවෙල හෝ පිරිසිදුකම තබාසිටීමට සභාව විසින් පත්කරනලද යමෙකු තමාගේ රාජකාරිය ඉෂ්ටකරමින් සිටින අතර ඔහුට බාධාකරන්නාවූ හෝ ඊට විරුද්ධව ක්‍රියාකරන්නාවූ එක එක අය නීතිවිරෝධි දෙයක් කිරීමේ වැරදිකාරයෙක් වේ.

15. පොදුජනයා විසින් යම්කිසි විශේෂවර්ගයක මාලු පාවිච්චිකිරීම හෝ ආහාරයට ගැනීම අන්තරාය සහිතයයි හෝ යම්කිසි බෝවෙන රෝගයක් පැතිර පවතින කාලය තුළදී යම්කිසි විශේෂ වර්ගයක පලතුරු හෝ එළවළු පාවිච්චිකිරීම හෝ ආහාරයට ගැනීම අනතුරුදායකයයිද සභාවට පෙනීයන කොයිකාලයක නමුත් වෛද්‍ය මූලාධිකාරීතැනගේ කීම පිට අණබෙර ගැස්වීමෙන් හෝ වෙනයම් සෑහෙන දැන්වීමක් මගින් එවැනි මාලු, පලතුරු හෝ එළවළු කිසිම වෙළඳ ශාලාවක්තුළ හෝ සනීපාරක්ෂක නගරසීමාතුළ වෙන ස්ථානයක හෝ සභාව විසින් වුවමනායයි සිතන කාලයක් අතරතුර විකිණීම තහනම්කිරීමටද එවැනි දැන්වීමක් කළායින් පසු එම ද්‍රව්‍යයන් විකිණීමට තිබා හෝ නොතිබා තිබුණත් ඒවා අල්ලාගනු ලැබ සභාව හෝ සභාපතිතැන විසින් අණකරනලද ක්‍රමයකින් විනාශකරවාදැමීමටද සභාවට බලය තිබේ.

16. බඩු පැටවීමට හෝ බෑමට උවමනා කාලයට වඩා දීර්ඝකාලයක් කිසිම වෙළඳශාලා භූමියක කොයිම කරත්තයක් හෝ රථයක් සිටවීමට නුසුදුසුවන.

17. සභාව විසින් සපයනලැබූ වසනලද භාජනයක හැර ප්‍රසිද්ධ වෙළඳශාලාවක් තුළ හෝ එහි අවට මිදුලකවත් පොදු ජනයාගේ සනීපයට බාධාවන හෝ අනතුරුය සහිත කුණුකසල, ඇට, සතුන්ගේ හම් හෝ අන්කිසි ද්‍රව්‍යයක් දැමීමට නුසුදුසුවන.

18. සභාව විසින් ගවයින් මරන මඩුවක් සපයනු ලැබූකල සභාව විසින් තැනූ ඒ ප්‍රසිද්ධ මඩුවේ නොමරනලද කිසිම සතෙක් ප්‍රසිද්ධ හෝ පුද්ගලික කිසිම වෙළඳ ශාලාවක විකිණීම හෝ විකිණීම පිණිස තැබීම හෝ නොකළයුතුයි. මෙම අතුරු නීතියේ කරුණු සිසිල්කරනලද මස්, දඩමස් හෝ පිටරටින් මේ දිවයිනට ගෙනෙනලද මාලු සම්බන්ධ නොවේ.

19. කොයිම ප්‍රසිද්ධ වෙළඳ ශාලාවකවත් කාමරයක් තබාගැනීමට හෝ එහි වෙළඳාම්කිරීමට බලයලත් යම්කෙනෙක් පිට පිටම දවස් දෙකක් අතරතුර ඒට සෑහෙන කාරණ දක්වන්ට නුසුදුසුවන්ව ඔහුකමින්ම මහජනයාගේ මෙහෙයකිරීම පැහැරහරීනම් නැතහොත් බැරිය කියන්නම් ඔහුගේ බලපත්‍රය කලකට අත්හිටවීමට හෝ ආපසු ගැනීමට සභාපතිතැනට බලය තිබේ.

B.—සාමාන්‍ය කරුණු.

(*a*) සභාපතිතැනගෙන් ලබනලද අවසරපත්‍රයක් නොමැතිව කිසිම පාන්ගෙයක්, භොජන ශාලාවක්, තේ හෝ කෝපි කඩයක්, මස්විකුණන කඩයක්, මාලු විකුණන ස්ථානයක්, ගවගාලක්, කිරිවිකුණන ස්ථානයක්, අපුල්ලන ස්ථානයක් හෝ සාමාන්‍ය නවාතැන්පළක් කොයිම සනීපාරක්ෂක නගරයක සීමාතුළ තිබීම කිසිවෙකුට බැරිය. ඉහතකී ස්ථානයෙන් හරියාකාර පැවැත්වීම පිණිස පැවතිගෙනඑන සනීපාරක්ෂක සභාවේ නීති හෝ පහත දක්වන අණපණත්වලටත් අනුව ක්‍රියාකිරීම අතපසුකරන කාට නමුත් එම අවසරපත්‍රය දීම ප්‍රතික්ෂෙපකිරීමට සභාපතිතැනට මෙයින් බලයදෙනලදී. එවැනි සෑම අවසර පත්‍රවලට එය නිකුත්කිරීමේ අන්තිම දිනයයි හඟවන දෙසැම්බර් මස 31වෙනි දින තුරු හෝ එවැනි අවසරපත්‍රය අවලංගු කරනතුරු බලය ඇතිවේ. එවැනි අවසරපත්‍රය නීතිඥයක මන්ත්‍රණ සභාගත ආණ්ඩුකාරතුමාගේ කැමැත්ත ඇතිව කලින්කල සනීපාරක්ෂක සමිතිය විසින් අරමුණුකරනු ලබන ගාස්තු ගෙවීමට වැඩිදුරටත් යටත්ව තිබියයුතුයි.

(*b*) ඉහතකී ස්ථානයක් හරියාකාර පැවැත්වීම පිණිස පැවතීඑන හෝ පහත දක්වන අණපණත් කඩකිරීමේ වැරද්දට යම් අයෙක් යම් උසාවියක් විසින් දෙවතාවක් හෝ වැඩි වාරගණනක් දඩුවම් කරනුලැබුවේනම් සමිතියේ සභාපතිතැන විසින් මේ පරිච්ඡේදය යටතේ එම අයට නිකුත්කරනලද එම අවසරපත්‍රය ඒ දෙවෙනි නඩුව හෝ ඊටපසු සිදුවුන නඩු හෝ විනිශ්චයකරන නඩුකාරතැන විසින් අවලංගුකරනු ලැබීමට බලය ඇතිවේ. එසේ අවසරපත්‍රයක් නඩුකාරතැන විසින් අවලංගු කළාහින් පසු එම අයට අළුත් අවසරපත්‍රයක් දීම තමාගේ කැමැත්ත ප්‍රකාර ප්‍රතික්ෂෙපකිරීමට සනීපාරක්ෂක සමිතියේ සභාපතිතැනට බලය මෙයින් දෙනලදී. එසේවුවද කොයිම දෙපාර්තමේන්තුවක් විසින් හෝ ඊට භාරව පවත්වනු ලබන කිසිම වෙළඳශාලාවක් තුළ තිබෙන කඩපළවල් මේ අණපණත්වලට අඩංගු නොවේ.

C.—පාන් ගෙවල්.

1. පාන්ගෙය යන්නෙන් මනුෂ්‍යයාගේ ආහාරය පිණිස විකිණීමට පාන්, බිස්කෝතු හෝ පැණිරස කෑම සාදන්නාවූ ඕනෑම ස්ථානයක් හඟවයි. තවද එබඳු ආහාර සෑදීමට සූදානම්කරනු ලබන හෝ එබඳු ආහාර සූදානම්කිරීමට උවමනා ද්‍රව්‍යයන් රැස්කර තබන්නාවූද කොයිම ස්ථානයක්වුවත් ඊට අන්තර්ගත වේ.

2. පාන්පිටි අණන කාමරය ඉතාම අඩුගණනේ පළල අඩි 12ක්, දිග අඩි 15කින් සම්පූර්ණවියයුතුයි. හොඳකාර වාතාශ්‍රය ඇතිවීම පිණිස අඩුගණනේ දෙපැත්තකින්වත් පළල අඩි 7ට අඩුනොවන අවකාශ ස්ථාන පිටතින් ඇත්වියයුතුයි, පෝර්තුවේ දොර පිටිඅනන කාමරය කෙලින් නොදැමිය යුතුයි. සෑම පිටිඅනන කාමරයකටම සීලිං තට්ටුවක් ඇතිවිය යුතුයි.

3. සෑම පාන්ගෙයටම වාතාශ්‍රය සහ ආලෝකය යහපත්සේ තැබිය යුතුයි. සෑම කොටස්ම භිත්ති උස අඩි 7කින් අඩු නොවන ගඩොල්, ගල් හෝ කබුක්වලින් බැඳිය යුතුයි. එහි ඇතුළ හුණෙන් කපරාරුකර හයමාසයකට වරක් සුදුහුනු ගෑ යුතුයි. වහල බොහෝකාලයක් පවතින ද්‍රව්‍යයකින් සෑදිය යුතුයි. සීලින් අවුරුද්දකට හතරසැරයක් බැගින් කපරාරුකර සුදුහුනු ගෑයුතුයි. නැතහොත් එය වාර්නිස්කරපු හෝ තීන්ත ගානලද ලෑලි ඉතා කිට්ටුවෙන් වද්දවා සෑදීමට පුළුවන. ගෙබිම සෑම්තැන්හි සිමෙන්ති දමා සෑහෙන පමනින් කානුවලින් යුක්තවිය යුතුයි. ඇරීමට හැකිවූද ගෙබිමේ ප්‍රමාණයෙන් දහසයෙන්පංගුවකට අඩුනොවන සම්පූර්ණ විශාලකමක් ඇතිවූද ජනේල සෑම කාමරයටම තැබිය යුතුයි.

4. පාන් සහ කැවිලි සාදන්ට පාවිච්චිකරන සියලුම භාජන ඉතාම පිරිසිදුව තිබිය යුතුයි. තවද ඒවා ගෙබිම සුද්ධ කරනවිට ඉවත්කිරීමටද හැකිවිය යුතුයි.

5. අඩුගණනේ පැය විසිහතරකට වරක් බැගින්වත් ගෙබිම පරීක්ෂා සහිතව සූරා අතුගෑම කළයුතුයි. තවද එම කුණු කසල දිය කාන්දුනොවන වසනලද භාජනයකට එම ඇසිල්ලේම දමා දිනපතා පාන්ගෙයින් පිටතට ගෙනයායුතුයි.

6. සෑම පාන්ගෙයම පිරිසිදු අන්දමේ තැබිය යුතුයි. තවද කානු වැසිකිළි හෝ අනිකුත් කුණු කසලින් නැගෙන අශුබ වාතයෙන් තොරවිය යුතුයි.

7. කිසිම පාන්ගෙයක් වැසිකිළියකින් හෝ පෝරගොඩකින් හෝ ඇරතිබෙන කුණුවළකින් අඩි 50ක් ඇතුළත නොතැබිය යුතුයි.

8. පාන් සෑදීමට ඕනෑකරන දේවල් හැර වෙන කිසිම බඩුවක් හෝ ද්‍රව්‍යයක් පාන්ගෙයතුළ නොතැබිය යුතුයි.

9. මේසවල මුදුන් හොඳකාර මෝරපු කිට්ටුකර වද්දනලද ලෑලිවලින් හෝ අන්තරාය රහිත දිය කාන්දුනොවන වෙනයම් ද්‍රව්‍යයකින් හෝ සෑදිය යුතුයි. තවද ඒවා දිනපතා සූරා සුද්ධකළයුතුයි.

10. කොයිම කාරණයක් හේතුකොටගෙන කිසිම සතෙක් පාන්ගෙයක තබානොගතයුතුයි.

11. බෝවෙන රෝගයකින් පෙළෙන්නාවූ හෝ පාන්ගෙයක් භාරකාරයා දැනුවත්ව බෝවෙන රෝගයකින් ළඟදීම පෙළිසිටියාවූ හෝ එවැනි රෝගයකින් පෙළෙන අයෙකුට සාත්තුකිරීමෙහි ළඟදී යෙදීසිටියාවූ කෙනෙකුට පාන්ගෙයට ඇතුල්වීමට හෝ එම පාන් බිස්කෝතු හෝ රසකැවිලි සෑදීමට හෝ විකිණීමට සම්බන්ධවීමට එම පාන්ගෙය භාරකාරයා විසින් ඉඩ නොදිය යුතුයි.

12. පාන් සෑදීමේ හෝ පිලිස්සීමේ යෙදී සිටින සියලුදෙනාම පාන් සෑදීමට පටන්ගන්ට පෙර අත්සෝදාගෙන පපුව සහ ශරීරය වැසෙන අන්දමේ පිරිසිදුවූ සුදුවැස්මක් සහ සුදු කැප් තොප්පියක් හෝ තලප්පාවක් ඇන්දයුතුයි.

13. පාන් බිස්කෝතු සහ රසකැවිලි සෑදීමෙහි යෙදී සිටින්නන්ගේ පාවිච්චියට හොඳ වතුර සහ සබන් සපයා තැබිය යුතුයි.

14. විකිනීමට තබනුලබන සියලුම පාන් බිස්කෝතු සහ රසකැවිලි ජාති මැස්සන්ට ඇතුල්වෙන්ට නුසුදුසුවන්වූ නිසි ලෙස සාදනලද විදුරුපෙට්ටිවල තැබිය යුතුයි. පෙට්ටි ඉතාම පිරිසිදුව තැබියයුතුයි.

15. පාන් සෑදීමට ගන්නා පිටි වතුර සහ අනිත් ද්‍රව්‍යයන් යහපත්ඒවා වියයුතුයි. තවද බිමෙන් අඩි 3ක් උස්කොට සාදනලද උස් ස්ථානයක පිටි තැබියයුතුයි.

16. පාන් පුළුස්සන ගෙවල්වලට අයිති මිදුල්වල තිබෙන කසල සියල්ලම දිනපතා ඉවත්කළ යුතුයි. කානුද හොඳකාර වතුර ගසා සේදියයුතුයි.

17. පාන්ගෙයි මට්ටමට ඇත්තාවූද එම ගොඩනැගිල්ලේ කොටසක් වන්නාවූද කිසිම ස්ථානයක බිමේ පටන් සිලිම දක්වා පැතිර තිබෙන ක්‍රමයකින් පාන්ගෙයින් හරියාකාර වෙන්කර නැත්නම් එය නිදාගැනීමට පාවිච්චි නොකළයුතුයි. මූත්‍රා කොටුවක් හෝ පස්දමා වහන අසූචි වළක් හෝ වැසිකිළියක් හෝ අළු වළක් පාන්ගෙය ඇතුලේ හෝ ඊට සම්බන්ධකර හෝ නොතැබිය යුතුයි.

18. සෑම සුදුසු වේලාවලටද පාන් පිළිස්සීම කරන්නාවූ ඕනෑම විටකදද පාන්ගෙට හෝ පාන් විකිණීමට තබා තිබෙන්නාවූ ස්ථානයට ඇතුල්ව සනීපාරක්ෂක සමිතියේ පරීක්ෂකතැන විසින් හෝ සභාපතිතැන විසින් ලියවිල්ලකින් බලයදෙනලද වෙන කෙනෙකු විසින් හෝ ඒවා පරීක්ෂාකිරීමට නීතියේ ප්‍රකාර බලය තිබේ.

19. මේ අණපනත්වල පිටපතක් රාමුවක දමා සෑම පාන්ගෙවල්වලම හොඳින් පෙනෙන ස්ථානයක එල්ලා තැබිය යුතුයි.

## D.—භෝජනශාලා, තේ සහ කෝපි කඩ.

1. සියලුම භෝජනශාලා, තේ සහ කෝපි කඩ සභාපතිතැන සතුටුවන අන්දමේ පිරිසිදුවූද සනීපාරක්ෂක විධියටද තැබිය යුතුයි.

2. යම්කිසි භෝජනශාලාවකට හෝ තේ හෝ කෝපි කඩයකට අයිතිවූ හෝ ඒවායේ පාවිච්චියට ගනුලබන භාජන ෆුරුමෝසම් බඩු සහ අනිකුත් උවමනා ද්‍රව්‍යයන් නිරන්තරයෙන්ම පිරිසිදුව තැබියයුතුයි.

3. සියලුම භෝජනශාලා සහ තේ හෝ කෝපිකඩවලත් සියළුම බිත්ති කපරාරුකර යටත්පිරිසෙයින් අවුරුද්දකට වරක් සහ සභාපතිතැන විසින් ලියුමකින් දන්වූවිට සුදුහුනු ගෑවියයුතුයි. තවද කාමර යහපත්සේ වාතාශ්‍රයෙන් සහ ආලෝකයෙන්ද යුක්තකළ යුතුයි.

4. යම්කිසි භෝජනශාලාවක හෝ තේ හෝ කෝපිකඩයක මිදුල්වල සහ ඒ අවට තිබෙන සියලුම කුණු සහ කසල දවසකට දෙවරක් බැගින් ඉවතදැමියයුතුයි.

5. බෝවෙන රෝගයකින් පෙළෙන්නාවූ හෝ භෝජනශාලාව හෝ තේ හෝ කෝපිකඩය භාරවසිටින තැනැත්තා දැනුවත්ව බෝවෙන රෝගයකින් ළඟදීම පෙළිසිටියාවූ හෝ එවැනි රෝගයකින් පෙළෙන අයෙකුට සාත්තුකිරීමෙහි ළඟදී යෙදීසිටියාවූ කෙනෙකු එවැනි භෝජනශාලාවේ හෝ කෝපිකඩේ ඇතුලේ හෝ ඒ අවට වැඩෙහි නොයෙදියයුතුයි.

6. එවැනි ස්ථානයන්හි පාවිච්චිකරන සීනි වීදුරුමූඩි ගසනලද පළල් කටවල් ඇති බෝතලවල තැබියයුතුයි.

7. විකිණීමට තබනලද සියලුම කේක්, රසකැවිලි යනාදිය මැස්සන්ගෙන් නිදහස්කොට නිසිලෙස සාදනලද වීදුරු පෙට්ටිවල තැබියයුතුයි. කිසිම කෑම ද්‍රව්‍යයක් මැස්සන් විසින් අපිරිසිදු කරනුලැබීමට නොහැරියයුතුයි. පාවිච්චිකරනුලබන වීදුරුපෙට්ටි ඉතා පිරිසිදුව තැබියයුතුයි.

8. අහක යන තේ හෝ කෝපි හෝ කිරි හෝ කෑමවල ඉතිරි කැබලි හෝ පිසීමේදී අහක යන ද්‍රව්‍යයන් ඊට නිසි භාජනයක එක්කාසුකර දිනපතාම ඉවත්කරනු මිස බිම විසිනොකළ යුතුයි.

9. කිසිම භෝජනශාලාවක හෝ තේ හෝ කෝපි කඩයක නරක කිරි විකිණීම හෝ දීම හෝ විකිණීමට තැබීම හෝ ඒවා එහි ඇතුළත තැබීම හෝ නොකළයුතුයි.

මේ පනත අනුව නරක කිරියයි කියන්නේ පැමිණෙන්නන්ගේ එවේලේම පාවිච්චිය පිණිස තේ හෝ කෝපි හෝ වෙනත් බීමක් සූදානම්කිරීමට නොව එහි ප්‍රමාණය වැඩිකිරීමට හෝ එහි නිසි ගුණය අඩුකිරීමට අදහස්කර වතුර හෝ වෙන යම් අන්‍ය දියරක් හෝ වෙන ද්‍රව්‍යයක් මිශ්‍රකරනලද කිරිවේ.

10. මේ අණපනත් රාමුවක දමා සෑම භෝජනශාලාවේ හෝ තේ හෝ කෝපිකඩේ හරියාකාර පෙනෙන ස්ථානයක එල්ලා තැබියයුතුයි.

## E.—මස්කඩ.

1. සියලුම මස්කඩ හොඳකාර වාතාශ්‍රයෙන් සහ ආලෝකයෙනුත් යුක්ත කළයුතුයි. එහි බිත්ති කපරාරුකර අඩු ගණනේ අවුරුද්දකට හතරසැරයක් බැගින් ඒවා සුදුහුනු ගෑයුතුයි. තවද ගෙබිම සිමෙන්ති දමා සෑහෙන පමන කානු සෑදියයුතුයි.

2. මස් තබාතිබෙන සියලුම කාමර ඉතා පිරිසිදුව තැබියයුතුයි.

3. මස්කඩවල පාවිච්චිකරන සෑම මේසයම සින්ක් තහඩුවලින් හෝ සභාපතිතැන විසින් පිළිගන්නාලද දිය කාන්දු නොවන වෙනයම් ද්‍රව්‍යයකින් හෝ වැසියයුතුයි. එබඳු මේස සහ මස් කපන කොටයද අනිත් උපකරණද ඉතා පිරිසිදුව තැබියයුතුයි. ඒවා පාවිච්චිකර ඉවරවූ ඇසිල්ලේම වතුරෙන් සෝදා තදවූ හොඳ බුරුසුවකින් මැද්දයුතුයි. මස් එල්ලා තිබෙන කොකු සියල්ලම හොඳකාර මැද මලකඩ රහිතව තැබියයුතුයි.

4. අහකයන්නාවූ සහ විකිණිය නොහැකි ද්‍රව්‍යයන්ද ලේකැටි ආදියද වහාම ඉවත් නොකරනුලැබේනම් ඇතුළ සින්ක් තහඩුවලින් වසනලද මැස්සන්ට යාමට නොහැකිවනාකාර සිදුරුඇති පියනකින් යුක්තවූ පෙට්ටියක දමා තැබිය යුතුයි.

5. මස්කඩවල් ඇතුළත සහ එහි අවටත් තිබෙන්නාවූ සියලුම කුණුකසල අඩුගණනේ දවසකට වරක් බැගින් ඉවත් කළ යුතුයි. තවද කානු හොඳකාර වතුර ගසා පවිත්‍රකළ යුතුයි.

6. බෝවෙන රෝගයකින් පෙළෙන්නාවූ හෝ යම් මස්කඩයක භාරකාරයා දැනුවත්ව එවැනි රෝගයකින් ළඟදී පෙළිසිටියාවූ හෝ එවැනි රෝගයකින් පෙළෙන රෝගාතුරයෙකුට සාත්තුකිරීමෙහි ළඟදී යෙදීසිටියාවූ කිසිවෙකු කිසි කඩයක භාරකාරයෙකු විසින් කිසිම මස්කඩයක වැඩකිරීමට නොයෙදිය යුතුයි.

7. මස් කපන සෑම අයටම අහකයන ද්‍රව්‍යයන් දැමීම පිණිස ඔබිනොබ ගෙනයන්ට හැකිවූද ලෝහජාතියකින් සාදනලද්දාවූද භාජනයක් සපයාදිය යුතුයි.

8. සෑම මස්කඩවල් සහ එහි ගනුදෙනුකිරීමද, කළමනාකිරීමද, සනීපාරක්ෂක සමිතියේ සභාපතිතැන විසින් හෝ සභාපතිතැන විසින් නිසියාකාර අවසරදෙනලද කෙනෙකු විසින් හෝ සෑම යෝග්‍ය අවස්ථාවල පරීක්ෂාකරනුලැබීමට අවකාශඇතිසේ තැබිය යුතුයි.

9. මෙම අණපනත් රාමුවක දමා මස්කඩේ හොඳකාර පෙනෙන ස්ථානයක තැබිය යුතුයි.

## F.—මාලුකඩ.

1. සෑම මාලුකඩම හොඳකාර වාතාශ්‍රය සහ ආලෝකයෙනුත් යුක්තකළ යුතුයි. සියලුම බිත්ති කපලාරුකර යටත් පිරිසෙයින් අවුරුද්දකට වරක් සහ සභාපතිතැන විසින් ලියමනකින් දැනුම්දුන් විටත් සුදුහුනු ගෑයුතුය. ගෙබිම සිමෙන්තියෙන් සහ ගලින් බඳිනලද කානුවකට හරියාකාර බැසගොස් බාල්දියකට ගලායෑමට සිහිදුලෙස දැමූ සිමෙන්තියෙන් යුක්තවිය යුතුයි. කානුව සහ බාල්දියත් බෙහෙත්වතුරදමා අඩුගණනේ දවසකට දෙවරක් බැගින් සේදිය යුතුයි. මාලු විකුණන ස්ථාන ලේබින්දු සහ දූවිලි රහිතව නිතරම පවිත්‍රලෙස තැබිය යුතුයි. තවද බිත්ති සහ ගෙබිම අලුත්වැඩියාකළ යුතුයි.

2. මෙහි ඉහළින්ම තිබෙන නියෝගයේ සඳහන්වන කානුව වෙනුවට සෝදන වතුර බාල්දියට වැටෙනාකාර සකස් කරනලද මැදට බෑවුමක් ඇති සින්ක්තහඩුවලින් හෝ ගල් සහ සිමෙන්තිවලින් සෑදූ ලොකු මේසයක් මාලු විකුණන්නා විසින් පාවිච්චිකළ හැකිය.

3. මාලුකඩයක පාවිච්චියට ගනුලබන සෑම මේසයම සින්ක්වලින් හෝ සභාපතිතැන විසින් පිළිගන්නාලද දිය කාන්දු නොවන වෙනයම් වැස්මකින් වැසියයුතුයි. එබඳු මේස සහ මාලු කපන කොටයද සියලුම උපකරණද ඉතා පවිත්‍රලෙස තැබිය යුතුයි. ඒවා පාවිච්චිකර ඉවරවූ ඇසිල්ලේම සෝදා තදවූ පිරිසිදු බුරුසුවකින් මැද්ද යුතුයි. මාලු එල්ලීමට ගන්නා සියලුම කොකු හොඳකාර මැද මලකඩ රහිතව තැබිය යුතුයි.

4. මාලුකඩා දිනපතාම සෝදා අව්ව සහ වාතාශ්‍රයත් ඇතිවීමට රක්ෂයක තැබිය යුතුයි. ඒවා මාලුකඩය තුළ නොතැබිය යුතුයි.

5. මාලුකඩ අයිති සෑම අයම අහකාශන ද්‍රව්‍ය දැමීම පිණිස ඔබ්බෙනාබ ගෙනයතහැකි ලෝහවලින් සාදනලද භාජන යක් සපයාගත යුතුයි.

6. මාලුකඩයක් ඇතුලේ හෝ එහි අවට තිබෙන්නාවූ සියලුම කුණුකසල අබුගණනේ දවසකට වරක් බැගින් ඉවත් කළ යුතුයි. තවද කාණු හොඳකාර වතුරගසා සේදිය යුතුයි.

7. බෝවෙන රෝගයකින් පෙළෙන්නාවූ හෝ මාලුකඩය බාරකාරයා දැනුවත්ව එවැනි රෝගයකින් ලඟදී පෙළී සිටියාවූ හෝ එවැනි රෝගයකින් පෙළෙන්නාවූ රෝගාතුරයෙකුට සාත්තුකෙරීමෙහි ළඟදී යෙදී සිටියාවූ කිසිවෙකු මාලු කඩය භාරකාරයා විසින් එවැනි මාලුකඩයක වැඩෙහි යොදනුලැබීමට ඇතුළත්කර නොගත යුතුයි.

8. සෑම මාලු විකුණන ස්ථානද ඒවායේ කළමනා කරවීම සහ ගනුදෙනු කිරීමත් සභාපතිතැන විසින් හෝ සභාපති තැන විසින් අවසරදෙනලද වෙන කිසිවෙකු විසින් හෝ සෑම යෝග්‍ය අවස්ථාවලත් පරීක්ෂාකරනුලැබීමට අවකාශ ඇතිසේ තැබිය යුතුයි.

9. මෙම ආණපණත් රාමුවක දමා හොඳකාර පෙණෙනතැනක සෑම මාළුකඩවලම එල්ලා තැබිය යුතුයි.

G.—ගාල්.

1. බලය දෙනුලැබූ සෑම ගාල්ම සභාපතිතැන විසින් ලියාපදිංචිකළ යුතුයි. "නොම්මර .... ලියා පදිංචිකරනලද ගාල" යන වචන සහ අයිතිකාරයාගේ නම පින්තාරුකරණලද දැන්වීම්ලෑල්ලක් බලයලත් තැනැත්තා විසින් එවැනි සෑම ගාලේම ඇතුල්වන ස්ථානයෙහි එල්ලා තැබිය යුතුයි.

2. සෑම ගාල්වල හෝ කරත්ත හෝ ගවයින් නවත්වන ස්ථානයන්හි සභාපතිතැනට සතුටු උපදවන ආන්දමේ එක ප්‍රමාණයට මට්ටම්කර නිසියාකාර කානු දැමිය යුතුයි. බිම මතුපිට තදව මට්ටමට තිබෙනාකාර සිමෙන්තිදමා හෝ ගල්කැලි අල්ලා හොඳකාර සවිව තබාගත යුතුයි. එවැනි ගාලක හෝ ගවයින් හෙවත් වෙන සතුන් තැබීමට පාවිච්චිකරනුලබන ස්ථානයන්හි තිබෙන සියලුම ගොඩනැගිලි 3වෙනි නියෝගය අනුව තිබීමට සෑදීම සහ තැබීම කළයුතුයි. එවැනි ගාල හෝ නවත්වන ස්ථානය දිනපතා හොඳකාර පවිත්‍රකරනුලබන අතරම පිරිසිදුව සහ සනීපාරක්ෂක ආන්දමට තබාගතයුතුයි. තවද ගොම සහ කුණුකසලත් මිනිසුන් වාසයකරන යම්කිසි ගෙවලින් ඈත සභාපතිතැන පිළිගන්නා ස්ථානයකට දවස්පතාම ඉවත්කළ යුතුයි. දිනපතා පවිත්‍රකිරීමට බාධාවන්නාවූ කිසිම බඩුවක් හෝ ලීදඬු ආදියක් හෝ වෙන යම් ද්‍රව්‍යයක් එවැනි ගාලක හෝ නවත්වන ස්ථානයක නොතැබිය යුතුයි.

3. ඉස්තාලයක් හෝ ගවමඩුවක් හෝ ගවයින් නවත්වන ස්ථානයක් හැටියට පාවිච්චිකරනුලබන සෑම ගොඩනැගිලි හෝ මඩු අයිතිකාරයා හෝ බදුකාරයා හෝ එහි පදිංචිකාරයා සභාපතිතැනට සතුටුදායකවනාකාර සෝදහරිනාදේ හෝ මුත්‍රා හෝ වැසිවතුර ගලායාමට නිසියාකාර සිමෙන්ති දමනලද කානු සෑදිය යුතුයි. ඒසේද වූවත් සභාපතිතැනට වුවමනායයි කල්පනා වේනම් එම කානුවලින් යන මුත්‍රා හෝ සෝදාදමන දේවල් සභාපතිතැන විසින් අණකළ පරිදි සාදනලද්දාවූද වැසුවාවූද භාජනය කට හෝ භාජනවලට වැක්කෙරෙනසේ එම කානු සෑදීමට සභාපතිතැනට අණකරන්ට පුළුවන. ඒවායේ තිබෙන කුණු ඒවා අයිතිකාරයාගේ හෝ බදුකාරයාගේ හෝ පදිංචිකාරයාගේ වියදමින් දිනපතාම ඉවත්කර එයින් කිසිම බධාවක් නොවන ක්‍රමයකට නැතිකරදැමීමට සැලැස්විය යුතුයි. එවැනි ගොඩනැගිල්ලක බිම සිමෙන්ති හාමුවූ ගඩොල්වලින් හෝ ගලෙන් හෝ සිමෙන්ති හා කළුගල්වලින් හෝ පහසුවෙන් පිරිසිදුව තබාගතහැකි සවිඇති වෙනයම් ද්‍රව්‍යයකින් සකස්කොට හොඳකාර අලුත්වැඩියාකරමින් තබාගත යුතුයි. එවැනි ගොඩනැගිල්ලක් සුදුහුනු ගෑහැකි ක්‍රමයට සාදාතිබේනම් එය හමාසයකට වරක් හෝ සභාපතිතැන අණකරණ යම් වාර ගණනක් එසේකළ යුතුයි. එසේ වූවත් එවැනි ගොඩනැගිල්ලේ හෝ මඩුවේ පවත් වාසයකරන ගෙයකට ඇති දුර හෝ වෙනයම් කාරණවක් හේතුකොටගෙන සභාපතිතැන එවැනි දෙයක් වුවමනා නැතැයි සිතානම් යථොක්ත නියෝගවලින් ඕනෑම එකක් ගැන සභාපතිතැනට බුරුල දියහැකිය. වැඩිදුර වත් සභාපතිතැනට උවමනායයි සිතේනම් ඉස්තාලයක් ගවමඩුවක් හෝ ගවයින් නවත්වන ස්ථානයක් හැටියට පාවිච්චිකරනු ලබන ඕනෑම ගොඩනැගිල්ලක් ගලින්, ගඩොලින් හෝ වෙන පවතින ද්‍රව්‍යයකින් සෑදීමටද උළු සෙවිලිකරනලද හෝ යකඩ වහලක් දැමීමටද අණකිරීමට සභාපතිතැනට පුළුවන.

4. සෑම ස්තාල, ගවමඩු හෝ ගවයින් නවත්වන ස්ථාන දිනපතා හොඳින් පවිත්‍රකර පිරිසිදුව සහ සනීපාරක්ෂක ආන්දමේ තැබිය යුතුයි. තවද ගොම සහ කුණුකසල වාසයකරණ ගෙවල්වලින් ඈත සභාපතිතැන විසින් පිළිගන්නා ස්ථානයකට දිනපතාම ඉවත්කර දැමිය යුතුයි.

5. සෑම ගාල්ම සභාවේ මූලාදෑනින් විසින් හෝ සභාපතිතැන විසින් ලියවිල්ලකින් බලයදෙනලද වෙන කෙනෙකු විසින් ඕනෑවිටක පරීක්ෂාකරනුලැබීමට අවකාශ ඇතුව තිබියයුතුයි.

මේ අතුරුපණත් යටතේ සම්පාදනයකිරීම පිණිස සභාපතිතැනට බලයදී තිබෙන සියලුම අණසෑ, ලියවිලිවලින් යුක්තවිය යුතුයි.

H.—කිරි වෙළඳම්පළවල්.

9E (2) (d) යන වගන්තිය යටතේ තිබෙන අතුරුපණත් උදෙසා කිරි වෙළඳම්පළ යන්නෙන් කිරි සපයනු ලබන්නාවූද විකිණීම පිණිස කිරි තබා තිබෙන්නාවූද යම් කිසි ගවයින් ඇතිකරන ස්ථානයක් ගවයින් ඇතිකරන ස්ථානයක ඇති ගෙයක්, එළදෙනුන් බඳින මඩුවක්, කිරි ගබඩාවක්, කිරි කඩයක් හෝ කිරි සපයන අන් කිසියම් ස්ථානයක් හඟවන්නේය. "කිරිකාරයා" යන්නට යම් එළදෙනුන් ඇතිකරන්නෙක්, කිරි ගෙනයන්නෙක් හෝ කිරි වෙළඳම්පළක පදිංචිකාරයෙක් ඇතුළත්වේ. තවද කිරි වෙළඳම්පළක් එක්කෙණෙකුට වඩා වැඩිගණනකට අයිතිවී තිබේනම් එවැනි අවස්ථාවන්හිදී එවැනි කිරි වෙළඳම්පළේ කළමනාකාරයා හෝ එහි සැබැවින්ම කළමනාකරණ වෙන අයයක් "කිරිකාරයා" යන්නෙන් හඟවන්නේය.

2. ඇර තිබෙන අසූචි වළකට හෝ බිම මතුපිට වැසිකිළියකට අඩි සියයකට ඇතුළත තිබෙන භූමියක හෝ නරක ගඳ ඒට ලඟාවෙන ස්ථානයක හෝ කිසිම කිරි වෙළඳම්පළක් නොතැබිය යුතුයි. තවද කිරි වෙළඳම්පළකට අඩි සියයක් ඇතුළත ඇර තිබෙන අසූචි වළක් හෝ බිම මතුපිට වැසිකිළියක් නොසෑදිය යුතුයි.

3. කිරි වෙළඳම්පළවල්වල මිදුල් සභාපතිතැනට සතුටුදායකවන ආන්දමේ නිසියාකාර සෑහෙන පමණ කානුවලින් යුක්තවිය යුතුයි. තවද කානුවලට වතුරගසා සේදිය යුතුයි. කිසිම කිරි වෙළඳම්පළක් අවට භූමියේ අපිරිසිදු වතුර එකතුවී තිබෙන්ට ඉඩනෑරිය යුතුයි.

4. කිරි වෙළඳම්පළක් ඇතුලේ සහ එහි මිදුල්වලත් තිබෙන කුණුකසල සියල්ලම කිසිම ප්‍රමාදයක්නැතුව ඉවතට දැමිය යුතුයි. ගොම දිනපතාම ඉවත්කළ යුතුයි.

5. සෑම කිරි වෙළඳම්පළේම පාවිච්චිය පිණිස පිරිසිදුවූ ආරක්ෂාකරනලද වතුර පහසු පමණ දුරින් සපයා තැබිය යුතුයි. මේ ජලස්ථානය සමීපයෙහි ස්නානයකිරීම හෝ රෙදි සේදීම නොකළ යුතුයි.

6. කිරි එළදෙනුන් සහ මීදෙනුන් ලෙඩවලින් තොරවී සිටිය යුතුයි. තවද බෝවෙන රෝගයකින් පෙළෙන්නාවූ හෝ කිරි වෙළඳම්පළක භාරකාරයා දැනුවත්ව එවැනි රෝගයකින් ළඟදී පෙළිසිටියාවූ හෝ එවැනි රෝගයකින් පෙළෙන රෝගාතුරයෙකුට සාත්තුකිරීමෙහි ළඟදී යෙදීසිටියාවූ තැනැත්තෙක් කිරි වෙළඳම්පළ භාරව සිටින අය විසින් එම කිරි වෙළඳම්පළේ මෙහෙකිරීමෙහි යොදනුලැබීමට අවසර නොදිය යුතුයි.

7. කිරි දෙවීමට පෙර දෙනුන්ගේ කිරි බුරුලු සහ තනපුඩුත් සෝදහවාද යනු සියළුම කිරි වෙළඳම්පළවල් භාරකාර යන් විසින් බැලිය යුතුයි. තවද කිරි දොවන්නා කිරි දෙවීමට පෙර ඔහුගේ අත් සබන් සහ වතුරෙන් හොඳකාර සෝදාගත යුතුයි. ගොමෙන් හෝ මුත්‍රාවලින් කිරි අපිරිසිදු නොවීමට සෑම ආකාරයෙන්ම ප්‍රවේසම්විය යුතුයි.

8. කිරිවෙළෙන්දෙකු හෝ කිරි වෙළඳම්පලක් අයිතිකාරයෙකු විසින් කිරිවලට වතුර හෝ වෙනයම් අන්‍යදියරක් හෝ ද්‍රව්‍යයක් හෝ මිශ්‍රකොට කිරිදූෂ්‍ය නොකළ යුතුයි. තවද ඔහු විසින් එසේකරනලද කිරිවිකිණීම හෝ විකිණීමට තිබීම හෝ නොකළ යුතුයි.

9. ප්‍රසිද්ධ නාන ස්ථානයකට වතුර ලිඳකින් සපයනු ලබනකල්හි කිසිවෙක් ඒ ළිඳේ ගවයන් හෝ වෙන සතුන් හෝ පැදුරු හෝ වෙනයම් දෙයක් හෝ ඔහු පැළඳී වස්ත්‍ර හැර වෙන රෙදි සේදීම නොකළයුතු, ඒ පැළඳි වස්ත්‍ර ගලක ගැසීම හෝ වෙන විධියකින් ගැසීම උවමනානම් එයින් ඉසිරෙන දිය ලිඳට නොවැටෙන තරමේ දුරින් සිට එසේ කළයුතුයි.

9වෙනි නියෝගයේ පංගාර්තුවට උවමනාකරන වෙනස්කිරීම් ඇතුව අතරින් අතර ස්වභාවට වෙනස් මාර්ගයකින් වතුර මාරුකරනු ලබන වැව් හෝ නාන භාජන හෝ සනීපාරක්ෂක සමිතියේ සභාපතිතැනගේ ආඥාව පිට විශෙෂවශයෙන් වෙන්කර තබනලද යම්කිසි ප්‍රසිද්ධ නාන ස්ථානයක් සම්බන්ධවද යොදනු ලැබේ.

10. කිසිම ප්‍රසිද්ධ නාන ස්ථානයක් අසල මල පැහැරීමෙන් හෝ මුත්‍රාකිරීමෙන් කිසිවෙකු විසින් දූෂ්‍ය ක්‍රියාවක් නොකළ යුතුයි.

## 8වෙනි පරිච්ඡේදය. [9 E (2) (M) සහ (N) යන වගන්තිය].

### සතුන් කොටුකරන ස්ථාන පාවිච්චිකිරීම පිණිස අයකරන ගාස්තු.

1. නගරයතුළ ප්‍රසිද්ධ පාරවල හෝ කුඩා මාර්ගයන්හි දඩාවතේ යන ගවයන්, එළුවන්, බැටළුවන් අල්ලනු ලැබූකල සමිතිය විසින් පිහිටුවනලද සතුන් කොටුකරතබන ස්ථාන ඇත්නම් ඒවායේ උන් තැබිය යුතුයි. තවද එසේ කොටුකරනුලැබූ සතුන් එයින් ඉවත්කරන්ට පෙර පහත දක්වන ගාස්තු ගෙවිය යුතුයි.

| | |
|---|---|
| එකෙක් දමා තැබීමට දවසකට හෝ දවසින් කොටසකට .. .. | ශත 25. |
| කෑම සපයා දුන්නොත් එකෙකුට දවසකට හෝ දවසින් කොටසකට .. .. | ශත 15. |

### බල්ලෝ.

2. දඩාවතේ යන බල්ලන් සියල්ලම අල්ලනු ලැබේ, තවද උන් ලෙඩ සහිතනම් හෝ උන්ට ලෙඩ තිබේයයි අනුමාන කළ හොත් විනාශකරනු ලැබේ. එසේ නැත්නම් සමිතිය විසින් පිහිටුවනලද කොටුවක කොටුකළ විට පළමුවෙනි දිනයට ශත 40 බැගින්ද එයින් පසු එක එක දිනයට ශත 15 බැගින්ද බල්ලාට අයිතිවාසිකම් කියා ඌ ගෙනයන්ට කැමති බල්ලා අයිතිකාරයාගෙන් සනීපාරක්ෂක සමිතියේ සභාපතිතැන විසින් දරනලද වියදම වැසියාම පිණිස අයකරනු ලැබේ. තුන් දවසක් ඇතුළතදී අයිතිවාසිකම් නොකියනු ලබන කොටුකරනලද බල්ලෝ නැතිකරනු ලැබෙත්.

## 9වෙනි පරිච්ඡේදය [9 E (2) (o) යන වගන්තිය].

1. විසිඑක් දිනක් කල්ඇතුව සභාපතිතැනට ලියවිල්ලකින් දැනුම්නොදීද පහත දක්වන නියමයන්පිට හැර නගරයේ සීමාතුළ වාසයකිරීම පිණිස ගෙයක් හෝ මඩුවක් සෑදීමට හෝ වාසස්ථානයක් හැටියට එහි පදිංචිවෙන්ට ඉඩහැරීමට කිසිවෙකුට නීතිප්‍රකාර යුතු නොවේ.

(a) කළුගල්, ගඩොල්, කබුක්ගල්, මැටි සහ වරිච්චි හෝ හොඳකාර කපරාරුකර සුදුහුනු ගෑමට හැකිවෙන වෙනයම් නිසි ද්‍රව්‍යයකින් හැර පොල්අතුවලින් බිත්තිතැනීම කළයුතු නොවේ.

(b) එබඳු සෑම ගෙය හෝ මඩුව හෝ මනුෂ්‍යවාසයට පාවිච්චිකරනුලබන කාමරයක් හෝ ප්‍රමාණයෙන් සම්පූර්ණ හතරැස් අඩි 120කට අඩුනොවද උසින් අඩි 10කට වඩා අඩුනොවද අගුව පොළවෙන් අඩි 6කට අඩු නැතුවද තිබියයුතුයි. සභාපතිතැනට මෙම නියෝගයේ බලය හීනකරන්ට නිසියයි සිතනවිට එබඳු නිදහසයක් කොපමණකල් පවත්වාගන්ට හැකිද යන කාලය සඳහන්කළ ලියනලද බලපත්‍රයක් නිකුත්කළ අවස්ථාවක හැර අනිකුත් සියලු තැන්හිදීම ගෙවල් සහ මඩු උළු සෙවිලි කරනලද වහලින් යුක්තවිය යුතුයි.

(c) මනුෂ්‍යවාසය පිණිස පාවිච්චිකරනුලබන හැම කාමරයටම උස අඩි 6ත් සහ පළල අඩි තුනෙන් අඩුනොවූ අඩුගණනේ එක දොරක් සහ උසින් අඩි 3ටත් පළලින් අඩි 2ටත් අඩුනොවූ අඩුගණනේ එක ජනේලයක්ද තැබියයුතුයි.

(d) සෑමවිලේම ගෙබිම පොළොවට වඩා අඩි 1ක් උසින් තැබියයුතුයි. එසේදවුවත් පිහිටීමේ හැටියට ඊට වඩා උස මට්ටමකට ගෙනඒමට කියාසිටීමට සභාපතිතැනට නිදහස තිබේ.

(e) මේ අතුරුපණතේ පංගාර්තුවලට විරුද්ධව සාදනලද යම් ගෙයක් හෝ මඩුවක් වෙනස්කිරීමට හෝ කඩාදැමීමට අයිතිකාරයාට දැන්වීමක් යවා මාසයක් ඇතුළතදී ඔහු එසේකිරීම අතපසුකරයිනම් නැතහොත් නොසලකානම් අයිතිකාරයාගේ වියදමින් එම ගෙය හෝ මඩුව කඩාදැමීමට සභාපතීතැනට බලය තිබේ.

2. පහත පෙනෙන නියමයන් පිට හැර කිසිම සනීපාරක්ෂක නගරයක සීමාතුළ ගෙයක් හෝ පැලක් තැනීමට හෝ නැවත තැනීමට හෝ ඒව එකතුකිරීමට කිසිවෙකුට බලයක් නැත. තනනලද හෝ නැවත තනනලද ගෙයක් හෝ මඩුවක් වටේට අමුතුවෙන් යාකරනලද ගෙයක හෝ පැලක ඒ අමුතු කොටස් වටේටද පහත දක්වනාකාර වාතාශ්‍රය පිණිස සම්පූර්ණ අවකාශ සහිත ස්ථානයක් ඉතිරිකළයුතුයි. එබඳු ගොඩනැගිල්ලක බිත්තිවල කිසිම කොටසක්වත් එබඳු ගොඩනැගිල්ලක වහලක පිටතට නෙරාතිබෙන අගුව අඩි 2කුත් අගල් 6කට වඩා එම අවකාශ ස්ථානයේ ඇතුළට නොතැබිය යුතුයි:—

(1) යම් පාරක හෝ වීථියක දෙපැත්තට එම පාරේ හෝ වීථියේ මැද සිට අඩි 25ක්ද

(2) කුස්සියක්, නාන ස්ථානයක්, වැසිකිළියක් හැර වෙන කොයිම ගෙයකට හෝ මඩුවකට සභාපතිතැන නියමකරන පරිදි අඩි 50 දක්වා එබඳු අවකාශ ස්ථානයට පිටිපස්සෙන්ද: එසේ නියමකරනලද අවකාශ ස්ථානයෙන් අඩුතරමට දෙකෙන් කොටසක්වත් තනනලද හෝ නැවත තනනලද හෝ අමුතුවෙන් කොටස් එකතුකරනු ලැබූ ගෙය පිහිටි ඉඩම අයිතිකාරයාවම හිමිව තිබියයුතුයි.

(3) එවැනි අවකාශ ස්ථානයෙන් අංශයක සිට සභාපතිතැන නියමකරන ආකාර ඉතා කිට්ටු ගොඩනැගිල්ලට අඩි 15ද එම නියමකරනලද අවකාශ ස්ථානයෙන් අඩුගණනේ භාගයක්වත් තනනලද හෝ නැවත තනනලද හෝ අමුතුවෙන් කොටස් එකතුකරනුලැබූ ගෙය පිහිටි ඉඩම අයිතිකාරයාට හිමිව තිබියයුතුයි.

එසේදවුවත් යම් විශෙෂ අවස්ථාවකදී මේ නියෝගයේ කාරණ සභාපතිතැනගේ කල්පනාවේ ප්‍රකාර හීන කරන්ටද අවකාශ තිබේ. නුමුත් එයින් (1) තැනීමට හෝ නැවත තැනීමට හෝ අමුතුවෙන් කෑලි එකතුකරනුලැබීමට තිබෙන්නාවූ ගෙයක හෝ මඩුවකද මනුෂ්‍යවාසය පිණිස පාවිච්චිකරනුලබන්නාවූ හෝ මනුෂ්‍ය වාසයක් හැටියට පාවිච්චිකිරීමට අදහස්කරන ලද්දාවූ අසල තිබෙන ගෙයක හෝ මඩුවක සනීපාරක්ෂක භාවයට සහ පිහිටි ගුණයන්ට අනතුරයක් සිදුනොවන බවත්:

(2) මතුවට පාරක් හෝ වීථියක් හොඳකාර දැමීමට පළල්කිරීමට හෝ දිග්ගුණුකිරීමටද හෙවත් එවැනි පාර හෝ වීථිය පාවිච්චිකරන මහජනයාගේ පහසුවටද එම නියෝගය එසේ හීනකිරීමෙන් කිසිම බාධාවක් නොවන බවත් යන කාරණ හොඳකාර නොපෙනේනම් සභාපතිතැන එසේ නොකළයුතුයි.

තවද වැඩිදුරටත් පාරකින් හෝ වීථියකින් ඉතාම දුර පැත්තකින් පිහිටි යම්කිසි ගෙයක අංශයකින් වාතාශ්‍රය පිණිස මෙසේ වෙන්කරනලද බිම්කොටසෙහි සභාපතිතැන පිළිගන්නා ස්ථානයක කුස්සියක් හෝ නාන ස්ථානයක් හෝ වැසිකිළියක් සෑදීමට ඉඩදීම සභාපතිතැනට පුළුවන.

තවත් වැඩිදුරටත් වැසිකිළි ශුද්ධකිරීම පිණිස තනනුලබන්නාවූ හෝ තනා තිබෙන්නාවූ හෝ සභාව විසින් අරමුණුකරන ලද්දාවූ පටු මාවතක් තිබෙන තන්හි එම වැසිකිළිය එකී පටුමාවතට හෝ අරමුණුකරනලද්දාවූ මාවතට යාවියයුතුයි.

## 10වෙනි පරිච්ඡේදය [9 E. (2) (t) යන වගන්තිය.]

### විෂ වාතජ්වරය හෙවත් කැලෑ උණ වැළැක්වීම.

1. වාසයකරන ගෙවල් අසල හෝ මිදුල්වල තිබෙන පහත් ස්ථාන වසාදැමිය යුතුයි. නැතහොත් ඒ ස්ථානයන්හි වතුර පල්නොවෙන ආකාර බැසයන පිණිස කානු තැනිය යුතුයි. යටකී භූමිභාගයෙහි තිබෙන්නාවූ වතුර දරාසිට පල්වීමට හැකිවූ උවමනා නැති යම්කිසි විධියක භාජන හෝ දිය රඳාතිබෙන දේවල් අහක්කළ යුතුයි.

2. ප්‍රසිද්ධ ශාලකට ඉස්තාලයකට හෝ දිවාරෑ දෙක්හි සතුන් නැවැත්වීම පිණිස පාවිච්චිකරන ස්ථානයකට හෝ වැසිකිළියකට අඩි 150ක් ඇතුළත සිසිල්බීම් සාදන ස්ථානයක් තබන්ට බැරිය, එම කර්මාන්ත ශාලාවේ කිසියම් කොටසක පදිංචිවීමද තහනම්ය.

3. කර්මාන්තශාලාව හොඳාකාර එළිය ඇතිවන අන්දමටද වාතය ඇතුල්වන අන්දමටද තිබෙන්ට ඕනෑය. බිමට සිමෙන්ති දමා නිෂ්ඵල ද්‍රව්‍ය පිටකිරීම පිණිස හොඳාකාර තනනලද කානු තිබෙන්ට ඕනෑවා සහ කුණුකසල සහ දූවිලි නැතුව පිරිසිදු ලෙසද තිබෙන්ට ඕනෑය. පැනිවගී සෑදීම මැස්සන්ට ඇතුල්විය නොහැකිසේ සාදනලද වෙනම කාමරයක කළයුතුයි. තවද එහි පාවිච්චිකරනු ලබන සියලුම බෙහෙත් වගී සහ අන්‍ය ද්‍රව්‍යයන්ද හොඳඒවා වියයුතුයි. වලං, භාජන සහ යන්ත්‍රාදියද ඉතා සැලකිල්ලෙන් පිරිසිදුව තබාගත යුතුයි.

4. බීම සෑදීම පිණිස ගන්නා වතුර අපිරිසිදුවිය නොහැකි අන්දමට හොඳට ආරක්ෂාකරනලද සහ සභාවේ සභාපතිතැන විසින් යෝග්‍යයයි පිළිගනුලැබූ ස්ථානයකින් ගතයුතුයි. එම වතුර කර්මාන්තශාලාවට ගෙනඒමේදී දූෂ්‍ය නොවන අන්දමකට ගෙනයිය යුතුයි. හරියාකාර සෑදූවාවූද, යන්ත්‍රය හා සම්බන්ධවූද වැන්කිවලට ඒ වතුර රැස්කොට තැබිය යුතුයි.

5. මේ සඳහා ගන්නාවතුර සභාවේ සභාපතිතැන විසින් ඒත්තුගනු ලැබූවාවූද යන්ත්‍රයට සම්බන්ධ ජුවැල් හෝ අන් කිසි වගීයක වතුර පෙරෙන ෆිල්ටරයකින් නොහොත් භාජනයකින් පෙරෙන්ට ඕනෑවේ එසේවූවත් පොදුජනයාට වතුර දෙන යෝග්‍යයයි භාරගත් ස්ථානයකින් බීම සෑදීමට වතුර ගත්තේනම් එසේ ගනු ලබන වතුර මේ නියෝගයට යටත් නොකිරීමට සභාපතිතැනට බලය තිබේ.

6. සිසිල්බීම පූරවනු ලබන සියලුම බෝතල පෙරාපු වතුරෙන් සේදිය යුතුවන් හැර ඉතාමත් පිරිසිදුව තිබෙන්ට ඕනෑය.

7. සිසිල් බීම පූරවනලද සියලුම බෝතලවල ඒ ඒ වගීයේ නමද, සාදනලද ස්ථානයද, එය සාදනලද කර්මාන්ත ශාලාවේ අයිතිකාරයාගේ හෝ සමාගමේ නමද, ඊට සනීපාරක්ෂාවේ සභාවේ සභාපතිතැන විසින් දෙනලද නොම්මරයද සඳහන් "ලේබල්" නම් පත්‍ර තිබිය යුතුයි.

8. අවුරුදු දොළහෙන් බාලවූ කිසිවෙක්ද බෝවෙන රෝගයකින් හෝ කුෂ්ඨරෝගයකින් පෙළෙන කිසිවෙක්ද සිසිල් බීම හෙවත් එයරේටඩ් වෝටර්ස් සාදන කර්මාන්ත ශාලාවක වැඩක යොදන්ට යුතුනැත.

9. සිසිල්බීම බෝතලවල ගැස්පූරවන වැඩේ යෙදී සිටින සියලුදෙනාම ඒ වේලාවේදී සියුම් සිදුරු ඇති කම්බිවලින් සාදනලද මුහුනුවැස්මක්ද, බෙල්ල ප්‍රවේසමට වැස්මක්ද හම්වලින් සාදනලද අත්මෙස්ද ඇඳ සිටිය යුතුයි.

10. සිසිල්බීම සෑදීමට වතුරගන්නා ළිං එමවැඩේට පමණක් වෙන්කර තැබිය යුතුයි. එහි නෑම තහනම්ය.

## 14වෙනි පරිච්ඡේදය. [9 E (2) (t) යන වගන්තිය.] ළිං සම්බන්ධ අතිරේක ව්‍යවස්ථා.

1. සනීපාරක්ෂක සභාවක් පිහිටි නගරයක සීමාවතුළ යමෙකු විසින් ළිඳක් හෑරීමට හෝ හැරවීමට මාසයකට ප්‍රථම එම සභාවේ සභාපතිතැනට නොදන්වා හෝ එම සභාපතිතැනගෙන් ඊට අවසරපත්‍රයක් නොලබා ළිඳක් හෑරීම හෝ හැරවීම නොකළ යුතුයි.

2. අසුචිවළකට කැතකුණු, වතුර රැස්කරනතැනකට, වැසිකිළියකට, ඌරුකොටුවකට, ගාලකට, හරක් මඩුවකට, පෝරගොඩකට, දියවැස්සෙන අගලකට, අත්හැර තිබෙන කක්කුස්සියකට, දිරායන එළවලු හෝ සත්ව ද්‍රව්‍යගොඩකට හෝ පෝරකරනලද ඉඩමකට අඩි 50කින් අඩු දුර ප්‍රමාණයක ළිඳක් හෑරීමට කිසිවෙකුට අවසර නැත.

3. බීමට සහ ගෙදර වැඩට වතුරගන්නා ළිඳකින් අඩි 50කට අඩු දුර ප්‍රමාණයක අසුචිවළක් කැතකුණුවතුර රැස් කරන තැනක්, වැසිකිළියක්, මුත්‍රාකොටුවක්, ඌරුකොටුවක්, ගාලක් හෝ හරක් මඩුවක් යනාදි මේවා සෑදීමද, පෝර, කුණුවී යන එළවලු සහ සත්ව ද්‍රව්‍යය ආදිය වැළලීම හෝ එක්කාසුකිරීමද පෝරජති දමා ගොවිතැන්කිරීමද දිය කාන්දුවන අගලක් තිබෙන්ට හැරීමද තහනම්ය.

4. සියලුම ළිං සිමෙන්ති මිශ්‍ර බදාමකින් ජලමට්ටම දක්වා ඇතුල්පැති ගඩොලින් බැඳ හෝ යකඩනල නොහොත් සිමෙන්ති බැම්මකින් නැතහොත් වෙනත් සුදුසු ආකාරයකින් ළිඳ ආරක්ෂාකොට ළිඳ පතුළෙන් හැර අන්‍ය ස්ථානයකින් වතුර ඉනීම වළකින අන්දමට තැනිය යුතුයි.

5. වතුර අදින අයවලුන්ට සිටීමට ළිඳ මතුපිට එක පැත්තක ළිං පඩියක් දැමිය යුතුයි. එම පඩිය ළිඳ වටේ සාදා තිබෙන මෙහි 6වෙනි වගන්තියේ සඳහන් වෙන බැම්මට වතුර වැක්කෙරෙන හැටියට එම ළිං පඩියේ ළිං කටේ මැද සිට වතුර පිටට බැස යන අන්දමට හැඩේ ඇතුව එහි ඇතුල්පැත්තේ වතුර කාන්දුනොවෙන ළිං බිත්තියේ කෙරවල් දෙකට පැස්සෙන්ට අඟල් 6ක් උස ඇති ලීස්තරයක් තිබිය යුතුයි. ළිඳේ ඉතුරුහරිය අඩුතරමේ අඩි 2කුත් අඟල් 6ක් උස ඇති තාප්පයකින් වටකිරීම යුතුයි.

6. ළිඳ වටේට පොළව මතුපිට අඩි 5ක් පළලට සහ පිටතට වතුර බැස යන අන්දමට හැඩේ ඇතිව ගලින් හෝ ගඩොලින් බැම්මක් බැඳ සිමෙන්ති දැමිය යුතුයි.

7. ළිඳ පිටවමේ බඳින බැම්මේ පිට කෙලවර වටේට සිමෙන්තියෙන් කානුවක් සෑදිය යුතුයි. ළිඳට කිට්ටුව වතුර නැවත්වීම වළක්වන පිණිස ඉහතකී කානුවෙන් වතුර බැස ගලායාමට දිගින් අඩි 10කට අඩුනොවන තවත් දිය අගලක්ද ඇතිවිය යුතුයි.

8. වතුර ඇදීම පිණිස සිටීමට හෝ වෙන කිසි කරුණක් ගැන ළිංකට හරහට ලෑලි නොදැමිය යුතුයි.

9. පිරිසිදුකම් ඇති භාජන ළිංවලටදමා වතුර ගැනීම කටයුතුයි.

10. බීමට හෝ වෙනත් ගෙදර වැඩවලට වතුරගන්නා ළිඳක ළිංකටේ සිට අඩි 20කින් අඩු දුර ප්‍රමාණයක රෙදිපිළි සේදීම නොකළ යුතුයි.

11. ප්‍රසිද්ධ නාන ළිං සමීපයේ අයිතිකාරයා විසින් හෝ බදුකාරයා විසින් මිනිසුන් නාන බාල්දි සම්පාදනය කළයුතුයි. වතුර නාන අයවලුන්ට වතුර අදින්ට ඉඩනොදිය යුතුයි. නාමින් සිටින කිසිවෙකු විසින් වතුර ඇදීම තහනම්ය.

12. ගෙඩි හෝ කොළ වැටෙන යම් ගසක් හෝ ගසක අත්තක් ළිඳ කටට ඉහලින් තිබේනම්, සනීපාරක්ෂක සභාවේ සභාපතිතැන හෝ සභාවේ අන්‍ය සනීපාරක්ෂක මූලාදෑනියෙක් එහි ගොස් විභාගකරබලා එම කොළ හෝ ගෙඩි වැටීම කරණකොටගෙන වතුර නරක්වීමට හේතු තිබේයයි එම අයට වැටහි ගියේවීනම්, එම ගස තිබෙන ඉඩම අයිතිකාරයාට හෝ බදුකාරයාට නොහොත් භාරකාරයාට එම ගස හෝ අත්ත කැප්පවීමට නියමකරනලද දැන්වීමක් යැවිය යුතුයි. තවද 14ක දවසක් තුළදී එම අය විසින් ඒ දැන්වීමේ ප්‍රකාර පිළිනොපැද්දේවීනම් ඔහු නීතියට විරුඬවූ වරදක් කළාවේ.

13. බීමට හෝ වෙනත් ගෙදර වැඩවලට වතුරගන්නා යම් ළිඳක වතුර ඉස්සවා ශුඬකර වෙනත් උවමනා රෙපයේරු වැඩ කළයුතුබව සනීපාරක්ෂක සභාවේ සභාපතිතැනට වැටහේනම් එසේකිරීමට නියමකර ලියනලද ආඥාවක් එම ළිඳ අයිතිකාරයාට හෝ බදුකාරයාට නොහොත් භාරකාරයාට යැවිය යුතුයි, තවද 14 දවසක් තුළදී ඔහු එම දැන්වීමේ ප්‍රකාර පිළිනොපැද්දේවීනම් ඔහු නීතියට විරුඬවූ වරදක් කළාවේ.

14. යම්විටක සනීපාරක්ෂක සභාවේ යෝජනාවකින් සනීපාරක්ෂාව පිණිස යම් ළිඳක් වැසීමට හෝ බෝවෙන ලෙඩ වැළක්වීම පිණිස එය ශුඬකිරීම යෝග්‍යබව තීන්දුකරගනීනම් එවැනි ළිඳක් පිහිටි ඉඩම අයිතිකාරයාට හෝ බදුකාරයාට හෝ භාරකාරයාට එසේකිරීමට නියමකොට ලියනලද ආඥාවක් යැවියයුතුවා පමණක් නොව එම ආඥාවේ ප්‍රකාර 8 දවසකින් එම වැඩකිරීමට අයිතිකාරයා හෝ බදුකාරයා හෝ භාරකාරයා බැඳිසිටින්නේය.

එකී කාලයතුළ ඒ ආඥාව පිළිනොපැද්දේවීනම් ඔහු නීතියට විරුඬවූ වරදක් කළාවේ.

15. ළිං හෑරීමට අදහස්කරනලද හෝ ලකුණුකරනලද ඉඩම් නොහොත් දැනට තිබෙන වෙනත් ළිං, ළිං පිහිටි ඉඩම් සහ අවට පිහිටි ඉඩම්ද පරීක්ෂාකර බැලීම පිණිස එහි ඇතුල්වීමට සනීපාරක්ෂක සභාවේ කළමනාකාර තැනට හෝ පරීක්ෂක තැනටද එම සභාවේ සභාපතිතැන විසින් ලියවිල්ලකින් බලය දෙනුලැබූ අන් කිසිවෙකුටද බලය තිබේ.

"A" උප ලේඛණය වෙළඳාම්පළවලට දෙන අවසරපත්‍ර.

ගාස්තු රුපියල් — — — මේස දරන — — — පදිංචි — — — ට අතුරුපණත්වලට යටත්ව — — — වෙළඳ ශාලාවේ නොම්මර — — — දරන වෙළඳාම්පළ පාවිච්චිකිරීමට අවසර තිබේ.

————

සනීපාරක්ෂක සභාවේ සභාපතිතැන.

ඉහත සඳහන්වූ නියෝග යටතේ අවුරුදුපතා දෙන අවසර පත්‍රවලට අයකළහැකි ගණන් ලේඛනය.

| අසරපත්‍රය. | නියෝගය. | | අවුරුදුපතා ගාස්තු රු. |
|---|---|---|---|
| පාන්ගෙවල් .. .. .. .. | 4 (c) | වෙනි පරිච්ඡේදය .. | 6 |
| භෝජනශාලා .. .. .. .. | 4 (d) | එම .. | 6 |
| තේ සහ කෝපිකඩ .. .. .. .. | 4 (d) | එම .. | 3 |
| මස්කඩ .. .. .. .. | 4 (e) | එම .. | 5 |
| මාලුපළවල් .. .. .. .. | 4 (f) | එම .. | 6 |
| කාමර 5ක් හෝ එයින් අඩුව ඇති ගව ගාල්වලට .. | 4 (g) | එම .. | 10 |
| සෑම වැඩිපුර කාමර 5හකට රුපියල් 10 පටන් .. .. | 4 (g) | එම .. | 100 |
| එලදෙන්නු 3 දෙනෙක් හෝ ඊට අඩුවෙන් හෝ සිටින කිරි වෙළඳාම්පළවල් | 4 (h) | එම .. | 3 |
| එලදෙන්නු 3 දෙනෙකුට වැඩිනම් .. .. .. | 4 (h) | එම .. | 6 |
| රෙදි අපුල්ලන ස්ථාන .. .. .. .. | 4 (i) | එම .. | 3 |
| පොදු නවාතැන්පළවල් .. .. .. | 4 (j) | එම .. | 6 |
| සම්පාදනකරන ස්ථාන .. .. .. .. | 12 | එම .. | 100 |
| හොන්ඩර 5ට වැඩිව උළුවලකඩ ගබඩාකිරීම .. .. | 12 | එම .. | 5 |
| හම්, ඇට සාදනලද පෝර හෝ එවැනි පෝර සෑදීම පිණිස ගන්නා ද්‍රව්‍ය ප්‍රමාණයෙන් එක ගෝනියකට වඩා ගබඩාකිරීමට .. .. | 12 | එම .. | 10 |
| කළුගල් හෝ කබුක්ගල් වළවල් .. .. .. | 12 | එම .. | 50 |
| රබාර් වළවල් .. .. .. .. | 12 | එම .. | 25 |
| ගඩොල් හෝ උළු කර්මාන්තය .. .. .. | 12 | එම .. | 15 |
| හුනුපෝරණු .. .. .. .. | 12 | එම .. | 12 |
| සිසිල්බීම කර්මාන්තශාලා .. .. .. | 12 සහ 13 | එම .. | 50 |
| ප්‍රසිද්ධ නාන ස්ථාන .. .. .. .. | 7 | එම .. | 6 |

---

## ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම්.

මාතර පලාතේ උප ඒජන්ත උන්නාන්සේ විසින් වර්ෂ 1923ක්වූ මාර්තු මස 24වෙනි දින හෝ ඊට මත්තෙන් මාතර කච්චේරියේදී තේ, රබර්, පොල් හෝ වෙනත් වැවිලි වැවීම පිණිස මෙහි පහත සඳහන් ආණ්ඩුව සන්තක ඉඩම් කැබෙල්ල වර්ෂ 1923ක්වූ මැයි මස 1වෙනි දින පටන් අවුරුදු 30කට අඩුනොවන්නාවූ සහ අවුරුදු 99කට වැඩිනොවන කාලයකට බදුගැනීමට ඉල්ලා ලියාඑවනලද ඉල්ලුම්පත්‍ර භාරගන්නේය. අක්කරයට හෝ අක්කරයෙන් කොටසකට රුපියල් 3ක ගණනේ මුදලද, ඉල්ළුම්කරණ අයවළුන්ගේ සම්පූර්ණ නම සහ පදිංචියද සඳහන්නොකළ ඉල්ළුම්පත්‍ර භාරගනුනොලැබේ. ඉඩමේ බද්ද විකුණනතුරු හෝ එම බද්ද විකුණන්නේ නැතැයිකියා උප ඒජන්ත උන්නාන්සේ නිශ්චයකරගන්නාතුරු ඉහතකී අන්දමින් තැන්පත්කරණලද මුදල ආපසු ගෙවනුනොලැබේ. ආණ්ඩුවට අයිති ඉඩම් බදුදෙන ආඥාපණත යටතේ එහි වගන්තිවලට අනුව වර්ෂ 1923ක්වූ අප්‍රේල් මස 17වෙනි දිනවූ අඟහරුවාදා උදේ 11ට මාතර කච්චේරියේදී බද්ද ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙනවා ඇත. බද්දවෙන්දේසියේදී ඉල්ලුම්කරන්ට පුළුවන්වන්නේ ඉහතකී ප්‍රකාරයට කලින් මුදල් බැඳ ඉල්ළුම්කරපු අයවළුන්ට පමණක. මේ ඉඩම් බද්දේ කොන්දේසි ආදිය මාතර උප ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒකේ සිතියම සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගන්ට පුළුවන. මෙම ඉඩම තේ සහ රබර්වලට සෑහෙන ඉඩමක්ය.

දකුණු දිසාවේ මාතර පලාතේ මොරවක්කෝරළේ.

මූල් සිතියමේ නො. 45. ගම—කොටපොල පිහිටි ඉඩම්.

| නො. | ඉඩමේ නම. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|
| 180 | වෙමැල්වලල්හේන .. .. .. | මුකලාන .. .. | 344 3 33 |
| 329 | පිපික්කේකනගහහේන .. .. .. | ලවල .. .. | 126 1 6 |

අක්කරයක තක්සේරු මිල 15යි.

අවුරුද්දකට අක්කරයකට බදුමිල රුපියල් 3යි, බද්ද පළමුවෙනි 6 අවුරුද්දට මින්තුනෙන් පංගුවක්වේ.

දකුණු දිසාවේ මාතර පලාතේ මොරවක්කෝරළේ.

මූල් සිතියමේ නො. 2. ගම—මොරගල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|
| M3½ | අන්නාසියස්හේන .. .. .. | බැද්ද .. .. | 42 0 20 |

අක්කරයක තක්සේරු මිල 8·50යි.

අවුරුද්දකට අක්කරයකට බදුමිල රුපියල් 3යි, බද්ද පළමුවෙනි 6 අවුරුද්දට මින්තුනෙන් පංගුවක්වේ,

වර්ෂ 1923ක්වූ පෙබරවාරි මස 27වෙනි දින
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සිසිල් ක්ලැමෙන්ටි,
මහලේකම්තාරිස් වම්හ.

---

No. 2,207, N.W. P.—වයඹ දිසාවේ ආණ්ඩුවේ මහ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහතසඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1923ක්වූ අප්‍රේල් මස 19වෙනි දිනවූ බ්‍රහස්පතින්දා පස්වරු 12.30ට කුරුණෑගල කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අනුමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල පලාතේ වන්නි, කටුගම්පොල, දඹදෙනි, දෙවමැදි, වැලිඹිලිහත්පත්තුවල පිහිටා තිබෙන බිම්කැබලි 29ක්.

මූල් සිතියම 5,192. ගම—වන්නිහත්පත්තුවේ මීඹෙයෙන් එගොඩ කෝරළේ මහනාන්නේරිය.

අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ රූ. ප. | අක්කරයක මිල රු. |
|---|---|---|---|---|---|
| 2 | දිවුල්ගස්හේන .. | තෙන්නකෝන්මුදියන්සෙලාගේ මුදියන්සේ, නවරත්න මුදියන්සෙලාගේ හේරත්හාමි, හේරත් මුදියන්සෙලාගේ අප්පුහාමි | හේන .. | 15 2 21 | 21 |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 3 | දිවුල්ගස්හේන | — | හේන | 5 | 1 | 34 | —* |

මුල් සිතියම 5,171. ගම—අන්ඹියකඹවල.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | අ. | රූ. | ප. | රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | අන්ඹියකැලේවෙල | කව්රාලගේ බසිරාල | කුඹුර | 2 | 2 | 39 | 21 |
| 2 | කෝනගහවැලිහේන | එම | බාල කැලේ | 1 | 1 | 18 | 21 |

මුල් සිතියම 5,161. ගම—කටුගම්පලහත්පත්තුවේ මැද්දකැටියකෝරලේ උඩබාගේ.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | අ. | රූ. | ප. | රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | කහටගහවෙලේපිල්ලෑව | ගොඩගංවෙල පදිංචි මුතුනායකදූරයලාගේ මැනිකා | හේන | 1 | 0 | 18 | 30 |

මුල් සිතියම 5,111. ගම—බැමිනිගල්ල.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | අ. | රූ. | ප. | රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | ගුනායකොටුව | රන්හොවපේඩිදූරයලාගේ බසිය | බාල කැලේ | 3 | 0 | 3 | 30 |
| 2 | එම | — | එම | 3 | 0 | 15 | —† |

සිතියම F. V. P. 250. ගම—පිටිගල්කෝරලේ කන්දෙපොල.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | අ. | රූ. | ප. | රු. |
|---|---|---|---|---|---|---|---|
| 4C | අඹගහවත්තෙ පිල්ලෑව | තම්මිටමුදියන්සෙලාගේ රන්සිරිනේලිස් පීරිස් | කැලේ | 0 | 2 | 35 | 40 |
| 7 | ඔබඩදෙනිය | කුරුප්පුමුදියන්සෙලාගේ පුංචිසිඤ්ඤො විසින් අල්ලාගත් කැල්ල | කුඹුර | 0 | 1 | 21 | 50 |

සිතියම F. V. P. 290. ගම—මැදපත්තු බස්නාහිරකෝරලේ උතුරවෙල.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | අ. | රූ. | ප. | රු. |
|---|---|---|---|---|---|---|---|
| 8J | නුගගහහේන | — | හේන | 2 | 1 | 26 | 40 |

සිතියම F. V. P. 329. ගම—හේන්ගෙඋල්ල.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | අ. | රූ. | ප. | රු. |
|---|---|---|---|---|---|---|---|
| 12 | නෙළුන්වලේ ඉස්වැටිය | සේරසිංහමුදියන්සෙලාගේ ඩිංගිරිබන්ඩා | දෙනිය | 2 | 1 | 14 | 60 |
| 12C | එම | එම | කුඹුර | 0 | 3 | 0 | 60 |

සිතියම F. V. P. 448. ගම—දඹදෙනිහත්පත්තුවේ නැගෙනහිර උඩුකහකෝරලේ හල්ලුවේ.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | අ. | රූ. | ප. | රු. |
|---|---|---|---|---|---|---|---|
| 12E | පිංකුඹුරහේන | ජිලත්මුදියන්සෙලාගේ අප්පුහාමි | හේන | 1 | 3 | 4 | 100 |

සිතියම F. V. P. 459 ගම—වල්දෙනිය.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | අ. | රූ. | ප. | රු. |
|---|---|---|---|---|---|---|---|
| 6A | ඉන්නවත්තලග හේන | — | එම | 1 | 1 | 4 | 45 |
| 6A1 | නාගහමුලහේන | — | එම | 0 | 2 | 16 | 45 |
| 6A2 | ගල්වලගාවහේන | — | එම | 0 | 1 | 18 | 45 |
| 6B | පල්ලෙගහමුලහේන | — | එම | 2 | 0 | 35 | 45 |
| 6B1 | කැන්දගොල්ලහේන | — | එම | 2 | 2 | 19 | 45 |
| 6B2 | තනපිටහේන | — | එම | 3 | 1 | 9 | 45 |
| 6B3 | නාගහමුලහේන | — | එම | 0 | 3 | 20 | 45 |
| 6E | ගල්පතගාවහේන | — | එම | 2 | 0 | 31 | 45 |
| 6E1 | මොරගහඇලහේන | — | එම | 1 | 1 | 29 | 45 |
| 33B | කැතිගානගලමුල හේන | — | එම | 1 | 2 | 4 | 45 |
